03/10/2010 - ඉරිදා ලංකාදීප

**විචාරශීලීව දකින අවස්ථාව හමුවට රට එළැඹ ඇත - මිලින්ද මොරගොඩ**

ගාලු මුවදොර කොළඹ නගරයේ පිහිටි සුන්දර විශාල අවකාශයක් ඇති බිමකි. කාර්ය බහුල සංකීර්ණ ප්‍රදේශයක නමුත් එහි සැනසිලිදායක සුවය විඳින්නට පිවිසෙන පිරිස බහුලය. එහි ගොස් සයුර දෙස බලන ඔබට ක්ෂිතිජය දක්වා විහිදෙන මහා මුහුදු කලාපය දැකිය හැකිය. කෙළවරකින් මතුවෙන නැවක්, හුදෙකලා වූ බෝට්ටුවක් පමණක් එහි ඇත.

මහ මුහුදෙන් වට වූ දූපතක දකින්නට හැකි අනිවාර්ය ලක්ෂණ විරලය. සංචාරයට, මසුන් අල්ලන්නට හෝ තැනකින් තැනකට ගමන් බිමන් යන්නට මහ මුහුද බහුල වශයෙන් භාවිතා කරන බවක් නොපෙනේ. විනෝදයට, අත්දැකීම් ලබන්නට රුවල් ඔරු, කුඩා නැව් සැරිසරනු දැකිය නොහැකිය. ආසියානු කලාපයේ මුහුද ප්‍රයෝජනයට ගෙන සීඝ්‍ර දියුණුවක් ලබා ඇති රටවල් දෙස බලන විට අප රට මහ මුහුද භාවිතා කරන්නේ නැති සෙයකි.

මෙසේ සිදුවන්නට බලපා ඇති කාරණාව කුමක්ද? අපේ ජීවිත මුහුදින් ඈත්වී ඇත්තේ ඇයි? මුහුද පමණක් ම නොව අප එදිනෙදා ක්‍රියාකරන ආකාරය ගැන අලුත් ඇසකින් බලන්නට කාලය උදා වී තිබේ.

ශ්‍රී ලංකාව අවුරුදු පන්සියයක් පමණ යටත් විජිතයක්ව පැවතිණ. මේ කාලය තුළ රටවැසියන්ට අලුත්න් සිතන්නට අවශ්‍යතාවයක් නොතිබිණ. අධිරාජ්‍යවාදීන්, අලුත් දේ නැවුම් ආකාරයට සිතන, අලුත් දේ සොයා යන නිදහස් මතධාරීන් බිහිවීම වලක්වන්නට ගත හැකි හැම පියවරක්ම ගත්තේය. ඔවුන් ට අවශ්‍ය වූයේ තමන් දෙන නියෝගය පිළිපදින සමාජයකි.  මවු රටට අවශ්‍ය තේ, රබර් හා කුලු බඩු මෙහි නිපදවා නැව් මගින් එරටට ගෙන යාම පමණකි. වෙළඳ ද්‍රව්‍ය නිපදවන, එයින් යැපෙන සමාජයට වඩා එපිට ලෝකයක් ගැන අවධානය යොමු කිරීමට ස්වදේශිකයන් වැලැක්වීය. ලාංකිකයන්නට යටත් වී සිටි යුගයේ එවැනි දේ සිතන්නට අවශ්‍යතාවයක් නොතිබිණ. අධිරාජ්‍යවාදීහු පාලනය, නීති රීති ආහාර පාන සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් ඇති කළහ. නිදහස ලැබීමෙන් පසු අලුත් යුගයක් ගැන අවධානය යොමු කරන ආකල්ප වෙනසක් ඇති වූ නමුත් නිදහස ලබා ගත වූ දශක හය අතුරින් හරි

අඩක් ගත වූයේ යුධමය වාතාවරණයකය. ත්‍රස්තවාදය මැඩ එයින් නිදහස් වී භීතියෙන් තොරව ජීවත්වෙන යුගයක් ගැන අවධානය යොමු කළ මහජනතාව පවතින රටාවට විකල්පය කුමක් ද යන්න ගැන මෙතෙක් අවධානය යොමු කළේ නැත.

කැළඹී තිබුණ ශ්‍රී ලංකාව සන්සුන් වී ඇත. උණ්ඩයෙන් හෝ බලහත්කාරයෙන් සිදුවූ බලපෑම වෙනුවට සමාජ පරිවර්තනයකට ලක්කරන විපර්යාසය මතු විය යුතුව ඇත්තේ අදහස් හා නව ජවයෙනි. ඒ වෙනුවෙන් පසුබිම සකස් විය යුතුව තිබේ.

මුහුද දෙස බලන විට එහි ඇති මතුකර ගත හැකි අවස්ථා අපමණය. කොළඹ සිට ගාල්ල මාතර හරහා කතරගම දක්වා මහා මාර්ගයේ ගමන් කරන නමුත් වෙරළට සමාන්තරව කුඩා බෝට්ටුවකින් හෝ නැවකින් එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ගමන් කළ නොහැකි ද යන ප්‍රශ්නය අප මතු කරන්නේ නැත. අධික වාහන තදබදයක, විශාල ඉන්ධන පිරිවැයක් දරමින් වෙහෙස වී ගමන් බිමන් යන හා භාණ්ඩ ප්‍රවාහනය කරන අප මේ විකල්පය ගැන අවධානය යොමු කිරීම අවශ්‍යය. දකුණට පමණක් නොව රට වටා මෙවැනි මුහුදු ප්‍රවාහන ජාලයක් ඇති කළ හැකිය. වේගයෙන් ගමන් කරන නැව් හෝ බෝට්ටු ගමනාන්ත දක්වා ඉක්මනින් මගීන් ගෙන යන අතර තැනින් තැන නතර කරමින් සෙමින් ගමන් කරන බෝට්ටු සේවයක් ද ඇති කළ හැකි නම් රට පුරා මාර්ග වල පැතිරී ඇති හිරිහැරකාරී ප්‍රවාහන සේවාවේ මුහුණුවර සම්පූර්ණයෙන් වෙනස් කරන්නට ඉඩ තිබේ. ආරක්ෂාව සම්බන්ධව පැවති ගැටලු අඩු හෙයින් ලංකාව වටා පමණක් නොව ප්‍රධාන ගංගා ඔස්සේ රට අභ්‍යන්තරයට ද මෙම සේවා ව්‍යාප්ත කළ හැකිය. ඉතිහාසය හදාරන විට ඔරු පාරු ඔස්සේ රට ඇතුලට භාණ්ඩ ගෙන ගිය අන්දමත්, එහි සිට දැව දඬු හා වෙනත් බවභෝග වරාය දක්වා ප්‍රවාහනය කළ ආකාරයත් පැහැදිලිව අධ්‍යයනය කළ හැකිය. එනමුත් පසුගිය දශක කිහිපය තිස්සේ මෙම ප්‍රවාහන මාධ්‍ය නොසැලකිල්ලට ලක්ව අභාවයට ගියේය. යළි මේ මුහුද අවට හා ගංගා ඔස්සේ ප්‍රවාහන සේවා ඇරඹෙන විට එයට සමාන්තරව අලුත් ආර්ථිකයක් බිහිවනු ඇත. ආර්ථික ප්‍රසාරණය සිදුවන්නේ එවැනි අලුත් අවස්ථා මගින්ය. නව ව්‍යවසායකයන්, කුඩා වෙළෙඳුන් මේ සේවාවන් වටා එකතුවන විට ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය වැඩිවෙයි.

අධිරාජ්‍යවාදීහු තම නාවික ශක්තියට අමතරව ස්වදේශිකයන්ගේ මුහුදු ගමන් අධෛර්යවත් කලහ. තමන්ට අවශ්‍ය නිපැයුම් රට අභ්‍යන්තරයේ තනන ලද මාර්ග හා දුම්රිය මාර්ග ඔස්සේ වරාය කරා ගෙන එන ආකාරය ගැන පමණක් ඔවුහු අවධානය යොමු කළහ. රට වටා දුම්රිය මාර්ග තැනීමේ දී වෙරළ බඩ ප්‍රදේශය සම්පූර්ණයෙන් ම ප්‍රයෝජනයට ගත් අතර මේ නිසා අදත් වෙරළබඩ සංචාරක කර්මාන්තයට අවශ්‍ය වටිනාම බිම් කොටස් දුම්රිය මාර්ගයට පමණක් සීමා වී තිබේ. අධිරාජ්‍යවාදීහු දුම්රිය මාර්ගය වෙරළ ට සමාන්තරව ඉදි කරන විට මහජනතාව ද උනන්දු වූයේ මුහුදු වෙරළට පිටුපා මහා මාර්ගයට මුහුණ ලා නිවාස ඉදි කිරීමටය. මහා මාර්ගයේ දිවෙන වාහන වලින් පිටවෙන දුම හා දූවිලි මැද සිටිමින් මුහුදට සිය නිවසේ අපද්‍රව්‍ය පිට කරන කාණු හරවා ඇති වර්තමානයේ ඉදිවන නිවාස පවා පෙන්වන්නේ අපේ අනන්‍යතාවයක් ගැන සිතන්නට සමාජය තවමත් පොහොසත් නැති බවයි.

මුහුදින් නෙත් හරවා අහස දෙස බැලුව හොත් අහස ද හුදෙකලාය. මහා මාර්ගයේ ධාවනයවන අති සුඛෝපබෝගී වාහන ප්‍රමාණය විශාලය. මේවායේ මිළ ගණන් සසඳන විට ඉතාමත් පහසුවෙන් කුඩා ගුවන් යානයක් මිළදී ගත හැකිය. ආයෝජකයන් ද ව්‍යාපාරිකයන් ද බදු රහිතව විශාල වියදමක් දරා මිළ අධික වාහන ගෙන්වා මහා මාර්ගයේ තදබදයට ලක්ව හිරිහැර විඳියි. කුඩා ගවන් යානයකින් කොළඹ සිට ලංකාවේ ඕනෑම තැනකට ගමන්කරන්නටත්, රට පුරා ඇති කුඩා ගුවන් තොටුපොල භාවිතා කරමින් නව ප්‍රවාහන සංස්කෘතියක් ඇති කරන්නටත් මෙම ඉහල ධනවතුන්ට අවස්ථාව තිබේ. එපමණක් නොවේ තාක්ෂණික අතින් දියුණු කුඩා ගුවන් යානා මුහුදටත්, වැව් ආශ්‍රිතවත් ගොඩබාන්නටත් යළි ගුවන්ගත වන්නටත් හැකියාව ඇත. මේවායේ මිළ වටිනා මෝටර් රථයක මිළට වඩා අඩුය. ත්‍රස්තවාදී ක්‍රියා පැවති කාලපරිච්ජේදයේ  මේ ගැන අවධානය යොමු නොකරන ලද නමුත් මේ ගැන දැන් අලුතින් සිතන්නට අපට හැකිය. එයින් කාලය අපතේ යාම වලකා ගැනීමට ව්‍යාපාරික හා ආයෝජකයන් වැනි ඉහල සමාජයට ඉඩ තිබේ. ඉහල සමාජය එයින් අවස්ථාව සකසා ගන්නා විට මහා මාර්ගයෙන් ඉවත්වන ඉඩ වඩා පහසුවෙන් භාවිතා කළ හැකිය.

දියුණු වෙමින් පවතින රටවල ඉඩම් උපරිම අන්දමින් භාවිතා කිරීම අත්‍යවශ්‍ය සාධකයකි. අනාගත අවශ්‍යතා සලකා ඉඩම් පිහිටීම අනුව ඒවායින් ගත හැකි ප්‍රයෝජන වෙනුවෙන් වෙනම කලාප ඇති කිරීම වැඩදායකය. කාර්මික, කෘෂිකාර්මික,

වෙළඳ හා නේවාසික වශයෙන් මෙම කලාප වෙන්කිරීම සුදුසුය. ශ්‍රී ලංකාවේ තැනින් තැන කාර්මික ජනපද පිහිටුවා තිබේ. නේවාසික කලාප විසිරී ඇත. නගර ආශ්‍රිතව පාලන, සේවා හා වෙළඳාම මිශ්‍රව විහිදී ඇත. අනාගත අවශ්‍යතා හා අභියෝග සලකා මෙම පවතින අසංවිධිත තත්ත්වය නිරාකරණය කර ගත යුතුය. පරිසරය ආරක්ෂා කර ගත යුතු තැන කර්මාන්ත බිහිවීමත්, නේවාසික කාර්යයන් සඳහා සුදුසු බිම් වල වෙළඳ සංකීර්ණ තැනීමත් එයින් වලකා ගත හැකිය. එය කළ හැක්කේ ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීමෙන් පමණකි. සියයට අනූවකටත් වඩා කම්හල්, කර්මාන්තශාලා පිහිටා ඇත්තේ බස්නාහිර පලාතේය. විශාල වශයෙන් ඉඩම් ඇති, මේ වන විට පොදු පහසුකම් හා යටිතල පහසුකම් වේගයෙන් සංවර්ධනය වී ඇති සෙසු පලාත්වලට කර්මාන්ත විහිදී නැත. මෙම ප්‍රදේශවල තරුණන් රැකියා සොයාගෙන බස්නාහිර පලාතට එකතු වන අතර මේ නිසා නිවාස, ප්‍රවාහන, ගමනාගමන හා සෞඛ්‍ය ප්‍රශ්න වැඩිවෙයි. කොළඹ ආශ්‍රිතව පමණක් ප්‍රධාන ස්ථාන වල බොරුල්ල සිරගෙදර, මැනිං එළවලු වෙළඳ පොළ හමුදා කඳවුරු කසල බැහැරලන ස්ථාන පිහිටුවා තිබීමෙන් ආර්ථික වශයෙන් වටිනා බිම් නිසි ප්‍රයෝජනයට නොගැනේ. දැනට පවතින එවැනි නගරයට නොගැලපෙන තැන් පවා ජනගහන වර්ධනය අනුව ඉඩ කඩ මද බව නිසා ප්‍රශ්න වලට මුහුණ පා තිබේ. මේවා පුලුල් කරන්නට ඉඩම් ඒ ආශ්‍රිතව නැත. එහෙත් මෙවැනි අංශ නගරයෙන් බැහැර විශාල වශයෙන් ඉඩම් ඇති ප්‍රදේශයක යළි ස්ථාන ගත කළහොත් ඒ ප්‍රදේශය අවට ද ආර්ථික පිබිදීමක් ඇතිවෙයි. සිර කඳවුර මොණරාගල හෝ වෙනත් ඉඩම් ඇති දිස්ත්‍රික්කයකය යොමු කළ හැකිය. මැනිං පොදු වෙළඳ පොළ දිවයිනේ සෙසු පලාත් වලට සම්බන්ධවන නගරයෙන් පිට පොදු තැනෙක ස්ථාපිත කළ හැකිය. ආරක්ෂාවට අවශ්‍ය ඒකක පවත්වා ගනිමින් යුධ හමුදාවේ පරිපාලන අංශ නගරයෙන් පිටතට ද, ගුවන් හා නාවික වැනි අංශ එයට ගැලපෙන ප්‍රදේශවලට ද යොමු කිරීම නගරයේ ඇති ඉඩකඩ නොමැතිකමේ විශාල ප්‍රශ්නය නිරාකරණය කරන්නකි. යුධ, ගුවන් හා නාවික වැනි ආරක්ෂක අංශ වටා විශාල පිරිසක් කේන්ද්‍රගතවී සිටී. ගැලපෙන අලුත් තැනෙක මෙම අංශ ස්ථාපිත වන විට එහි නිලධාරීන්ටත් අවට වෙසෙන ජනතාවටත් ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි පාසල්, රෝහල් වෙළඳ සංකීර්ණ බිහිවෙයි. එය පවතින ආර්ථිකය තවත් ප්‍රසාරණය වීමට ඉඩ දෙන්නකි. දැනට අගනුවර ආශ්‍රිතව කේන්ද්‍රගත වී ඇති නේවාසික හා කාර්යාල සංකීර්ණ වෙනත් කලාප වශයෙන් ඇති කිරීම ද විකල්ප අදහස් ඇතිව කළ හැකිය. මේ

ගැන අලුතින් හිතන්නට අපට කාලයක් උදා වී තිබේ. තවමත් කොළඹ හා තදාසන්න නගර කුණු කසලින් පිරී ඇත. පලාත් පාලන ආයතන කොතරම් මුදල් වියදම් කළත් කැලි කසල ඉවත් කිරීම ප්‍රශ්නයකි. වෙනත් රටවල් දැන් මෙවැනි අබියෝග ජය ගෙන ඇත්තේ කැලි කසල විදුලිය නිපදවමට යොදන අමුද්‍රව්‍යයක් දක්වා පාවිච්චි කිරීමට දක්ෂ වීමෙන්ය.

අලුත් ආකල්ප ඇතිව අප ක්‍රියා කළ යුතුය. නිදහස් අධ්‍යාපනය ගැන කතා කරයි. එහෙත් දරුවන්ගේ ඉගෙනීමට දෙමාපියන්ට කරන්නට සිදුවී ඇති අතිරේක වියදම විශාලය. පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා අතිරේක පන්ති පැවැත්වේ. මේවායේ අධ්‍යාපනය හදාරන්නේ නැති දරුවෙක් නැත. ටියුෂන් අධ්‍යාපනය ඒ තරමට ව්‍යාප්ත වී ඇතත් අප සියලු දෙනාම මේ පවතින ක්‍රමය නිදහස් අධ්‍යාපනය බවට හිත හදා ගෙන සිටී. මේ අධ්‍යාපනයේ කෙළවර ඉතාම සීමිත පිරිසකට විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට වරම් ලැබීමයි. තවත් ලක්ෂ ගණනක දරුවන් විශාල මුදල් සම්භාරයක් වැය කරමින් විදේශ රටවලට ගොස් හා මෙරට දී විදේශික අධ්‍යාපන පාඨමාලා හදාරති. මේ අධ්‍යාපනය මේ රටේ ම ඇති කරන්නට ඉඩ සැලසීම නිදහස් අධ්‍යාපනයට අකුල් හෙලීමක් බව සිතන අප දැන් පවතින නොදැනීම මුදල් ගලාගෙන යන අධ්‍යාපන ක්‍රමය නිදහස් අධ්‍යාපනය බව සිතා හිත රවටා ගන්නේ ඇයි? මේ ගැන දේශපාලන රාමුවකින් තොරව විවෘතව කතා කර නිසි තීන්දු ගන්නට අපට හැකියාවක් නැත්තේ ඇයි? තොරතුරු තාක්ෂණය අතින් ලෝකය ඉහලට ගොස් තිබේ. ශ්‍රී ලංකාවේ දියුණුව ප්‍රමාණාත්මක නැත. තරුණ හා ළමා පරපුර පරිගණකය හා තොරතුරු තාක්ෂණය සමග එකතුවන්නට උත්සාහ කරයි. ඔවුන්ට ඒ වෙනුවෙන් මෙයට වඩා අවස්ථාවක් ලබා දෙන්නට අවධානය යොමු නොකරන්නේ ඇයි?

සෞඛ්‍ය සේවාව ද මේ ආකාරයේ ම වෙනසකට ලක් නොවූ යල් පැන ගිය ආකෘතියකි. රජයේ රෝහල් තිබේ. ඒවායේ වාට්ටු රෝගීන්ගෙන් පිරී ඇත. පරීක්ෂණ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හිඟය. බේත් හේත් නැත. රජය විශාල මුදලක් වාර්ෂිකව වියදම් කළත් පරිපාලනයට කිසි හොඳක් අහන්නටත් ඉඩ නොලැබේ. සියලුම රෝගීන් වෛද්‍යවරු චැනල් කරති. මේ චැනල් ගාස්තුව ඉතා ඉහල අතර එහි කිසිදු පාලනයක් නැත. පෞද්ගලික රෝහල් තිබේ. ඒවායේ ප්‍රතිකාර ගන්නට වැය වන මුදල දරාගන්නට සමාජයේ විශාල ජන කොටසකට හැකියාවක් නැත. මේ පද්ධති දෙක අතර මැද විශාල

ජන කොටසක් පීඩා විඳින නමුත් අප සැනසී සිටින්නේ මේ ක්‍රමය නිදහස් සෞඛ්‍ය සේවාව බව කල්පනා කරමිනි. මේ ක්‍රමය වෙනස් කරන්නට, විකල්පයක් ගැන සොයන්නට උනන්දු වුව හොත් එය බරපතල අපරාධයක් සේ දැකීම යුක්ති සහගතද? අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි අංශ වල ආයෝජනයට පුද්ගලික අංශයට වඩා වැඩි ඉඩක් දෙන අතර රජයට මෙම අංශ කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදනය කරමින් නියාමනයක නිරත විය හැකිය. නිසි ප්‍රමිතියකින් යුතුව පුද්ගලික පාසල් හා පුද්ගලික රෝහල් පවත්වාගෙන යනවාදැයි නිරීක්ෂණය කරන්නට රජයට හැකි නම් අද මෙම ක්ෂේත්‍රවල ඇති ගැටලු නිරාකරනය කර ගැනීමට අවස්ථාව තිබේ. එපමණක් නොව මෙවැනි සේවාවන් ලබා ගැනීමට ඉඩ නැති අඩු ආදායම් ලබන ජනතාවට පහසුව සැපයෙන අයුරින් ශිෂ්‍යත්ව හා රක්ෂණ ක්‍රම හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් මිලියන දෙකක් පමණ විදේශ ගතව සිටී. මෙයින් කොටසක් ත්‍රස්තවාදය හමුවේ රට හැර ගොස් විදේශයන්හි පදිංචිව සිටින පිරිසයි. විශාල කොටසක් මැදපෙරදිග හා යුරෝපීය රටවල සේවය කරති. මේ කොටස ජාත්‍යන්තරයේ දැන් පවතින ස්වභාවය දකී. ඒ රටවල දියුණුව, විනය හා සමාජ රාමුව ගැන අවබෝධයක් ඇත. ඒ රටවල් දියුණු වී ඇත්තේ අනුගමනය කරන ලද පැහැදිලි ප්‍රතිපත්ති හා නිවැරදි සැලසුම් නිසා බව අවබෝධයක් ඇත. නමුත් ආපසු මේ රටට පැමිණෙන ලාංකිකයන් ඒ රටවල අත්දැකීම් මේ රටේ දී කතා කරන්නේ ඒවා අපට හරියන්නේ නැහැ යන පටු ආකල්පයෙන්ය. බටහිර රටක පාරට කුණු වීසි නොකරන, බස් නැවතුමක් කරා ඇවිද ගෙන යන, පාර මාරුවෙන ස්ථානයකින් හැර පාර නොපනින එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයෝ මෙරටට පැමිණි වහා ඒ සියල්ල අමතක කර ලංකාවේ හැටියට ක්‍රියා කරති.

පොලිසිය, නීතිය, දේශපාලනය වැනි කාරණා ඇතුලු මෙරට ආර්ථිකයට සමාජයට බලපාන සියලු දේ ගැන අලුත් කෝණයකින් බලන්නට අවශ්‍ය මොහොත උදා වී තිබේ. දේශපාලනඥයන් විසින් නීති ඇතිකර රාමුව සකස් කර එහි ස්ථාන ගත කරන්නට කලින් පොදු මහජනතාවට හා විද්වතුන්ට මෙකී කරුණු ගැන ගැඹුරින් සිතා විකල්ප යෝජනා ගෙන එන්නට අවස්ථාව තිබේ.

ශ්‍රී ලංකාව අලුත් යුගයකට ඇතුලු වෙමින් සිටින වකවානුවයි. යුධ කාල පරිච්ඡේදය වැනි අන්ධකාර යුගයක සිට අරුණාලෝකය ගලා එන අවස්ථාවක් කරා රට ගමන් කරමින් සිටී. අතීතයේ අමිහිරි අවස්ථාවන් වෙනුවට යහපත් අනාගතයක් වෙනුවෙන් පවතින තත්ත්වය වඩා යථාර්ථවාදී අන්දමට හසුරුවා ගන්නේ කෙසේ දැයි විචාරශීලීව දකින අවස්ථාව හමුවට රට එළැඹ ඇත.